# 7

# මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

දේශීය සහ ගෝලීය ආර්ථිකයේ පවතින සහ අපේක්ෂිත වර්ධනයන් සලකා බලා 2018 වසරේ පළමු මාස නවය තුළදී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව පරීක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කළේය. උද්ධමනයෙහි සහ උද්ධමන අපේක්ෂාවල හිතකර වර්ධනයන් මෙන්ම, ආර්ථිකයේ මන්දගාමී ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගෙන 2018 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව 2015 වසර අවසානයේ සිට ක්‍රියාත්මක වූ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අවසන් කෙරෙන බව පෙන්නුම් කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8.50 දක්වා පදනම් අංක 25 කින් අඩු කළ අතර, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 7.25 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගනිමින් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පරාසය පදනම් අංක 150 සිට පදනම් අංක 125 දක්වා පටු කළේය. කෙසේ වුවද, ආර්ථිකයේ විදේශීය අංශයෙහි ස්ථායිතාව සඳහා බලපෑම් කළ ගෝලීය ආර්ථික වර්ධනයන් සලකා බලා ඉන්පසු කාල සීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන ගියේය. දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන මිල ගණන් සහ අනෙකුත් පරිපාලිත මිල ගණන් ඉහළ නැංවීම හේතුවෙන් උද්ධමනය තාවකාලික වශයෙන් ඉහළ යෑම හමුවේ වුවද, 2018 පළමු මාස නවය තුළදී කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) මත පදනම්ව මනිනු ලබන මතුපිට උද්ධමනය බොහෝවිට ඉලක්කගත සියයට 4-6 පරාසයේ පැවති අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) මත පදනම් වූ මතුපිට උද්ධමනය ද අඩු මට්ටමක පැවතිණි. මේ අතර, කො.පා.මි.ද. මෙන්ම, ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය මගින් මනිනු ලබන ඉල්ලුමෙන් ජනිත වන උද්ධමනය ද අඩු මට්ටමක පැවතිණි. වසර තුළ දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව බොහෝ විට අතිරික්ත මට්ටමක පැවතියද, 2018 ජූනි, ජූලි සහ සැප්තැම්බර් මාසවලදී ප්‍රධාන වශයෙන් ද්‍රවශීලතාව හිඟ මට්ටම්වල පැවතිණි. 2018 අප්‍රේල් මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පහත හෙළීම සහ වර්ධනය වූ වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වයට කෙටිකාලීන පොලී අනුපාතික ප්‍රතිචාර දැක්වූ නමුත්, විදේශ විනිමය වෙළඳපොළ තුළ පීඩනයක් පවතින අවස්ථාවලදී කෙටිකාලීන පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව කරා ඉහළ යෑමට ඉඩ සලසන ලදී. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ඵලදා අනුපාතික මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කළ අතර, අනෙකුත් බොහෝ වෙළඳපොළ පොලී අනුපාතික නාමික සහ මූර්ත වශයෙන් සාපේක්ෂව ඉහළ මට්ටම්වල පැවතිණි. පෙර වසරවලදී පවත්වාගෙන යන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින් පුළුල් මුදල් සැපයුමේ වර්ධනය අඛණ්ඩව අඩු වූ අතර, ක්‍රමයෙන් මන්දගාමී වූ පෞද්ගලික අංශය සඳහා සපයන ලද ණය වර්ධනය එයට ප්‍රධාන වශයෙන් හේතු විය. රජය විසින් බැංකු අංශය වෙතින් ලබාගත් ණය අඩු වර්ධනයකින් ප්‍රසාරණය වූ අතර රාජ්‍ය සංස්ථා විසින් වාණිජ බැංකු වෙතින් ලබාගත් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඉදිරියේදී ඇති විය හැකි කෙටිකාලීන මිල පීඩන හමුවේ වුවද, මැදිකාලීනව උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂිතය. 2020 වසර වනවිට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත යොමු වීම සම්බන්ධයෙන් 2018 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇත.


## ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය

- **උද්ධමනය මැදිකාලීනව මැදි-තනි අගයක මට්ටමේ ස්ථායීව පවත්වා ගැනීම සහ එමගින් ආර්ථිකය තිරසාර වර්ධන මාවතකට යොමු කිරීමට පහසුකම් සැලසීම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් (Flexible Inflation Targeting Framework) වෙත යොමු වීමේ අරමුණු සහිතව වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේය.** නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත යොමු වීමේ වැදගත් පියවරක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් සමස්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති රාමුවෙන් ක්‍රමයෙන් බැහැරවී 2015 වසරේදී වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් වෙත යොමු විය. මෙම අන්තර්කාලීන රාමුව තුළ වෙළඳපොළ පොලී අනුපාතික හැසිරවීම සහ උද්ධමනය මත බලපෑම් ඇති කිරීම සඳහා මෙහෙයුම් ඉලක්කය ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) යොදා ගනු ලබන අතර, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අතරමැදි දර්ශක විචල්‍ය ලෙස පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) යොදා ගනු ලැබේ. තවද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මෙහෙයවීම සඳහා ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ ලෙස වෙළඳපොළ පදනම් කරගත් මුදල් ප්‍රතිපත්ති උපකරණ, විශේෂයෙන්ම ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළඳපොළ කටයුතු යොදා ගනු ලැබේ. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබූ අතර, 2020 වසර වන විට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත පහසුවෙන් යොමු වීම සඳහා වන ප්‍රධාන ප්‍රතිසංස්කරණ ආයතනගත කිරීම සිදු කළේය. ඵලදායී නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක ප්‍රධාන මූලිකාංග ලෙස මහ බැංකු ස්වාධීනත්වය, පාලනය, විනිවිදභාවය, වගවීම සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉහළ බලතල පැවතීමේ අවශ්‍යතාව "*2018 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති" (පෙර දැක්ම 2018)* මගින් හඳුනාගෙන ඇති අතර, ශ්‍රී ලංකාවේ මහ බැංකුකරණයට අදාළ ප්‍රධාන නෛතික ප්‍රතිපාදනය වන මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා අදාළ යෝජනා ඉදිරිපත් කිරීමේ වැඩපිළිවෙළක් ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ කළේය. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ සහ ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රමවත් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ඇතිව මහ බැංකුව තුළ ආකෘතිකරණ හා පුරෝකථන හැකියා සහ අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ද ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

- **දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන සහ අනෙකුත් පරිපාලිත මිල ගණන් ඉහළ නැංවීම හේතුවෙන් සිදුවූ තාවකාලික ඉහළ යෑම් හමුවේ වුවද, පාරිභෝගික මිල උද්ධමනය 2018 වසරේ පළමු මාස නවය තුළදී අපේක්ෂිත පරාසයේ පැවතිණි.** ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013 = 100) මත පදනම් වූ මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2017 දෙසැම්බර් මස අවසානයේ පැවති සියයට 7.3 සිට 2018 අප්‍රේල් මාසය වන විට සියයට 1.6 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. පරිපාලිත මිල ගණන් ඉහළ නැංවීමේ බලපෑම හේතුවෙන් ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2018 ජූලි මාසයේදී සියයට 3.4 දක්වා වැඩි වුවද, නිතර මිල උච්චාවචන සහිත ආහාර මිල ගණන් පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2018 සැප්තැම්බර් මාසයේදී මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.9 දක්වා මන්දගාමී විය. වාර්ෂික සාමාන්‍ය පදනම අනුව සලකා බලන විට, ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 7.7 සිට 2018 සැප්තැම්බර් මාසයේදී සියයට 4.0 දක්වා අඩු විය. කාලගුණය ආශ්‍රිත අවහිරතා අඩුවීම තුළින් ඇතිවූ සැපයුම් අංශයේ හිතකර වර්ධනයන්හි ප්‍රතිඵලයක් ලෙස ආහාර උද්ධමනය අඩුවීම හේතුවෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය ද 2017 දෙසැම්බර් මස අවසානයේ පැවති සියයට 7.1 සිට 2018 අප්‍රේල් මාසයේදී සියයට 3.8 දක්වා අඩු විය. කෙසේ වෙතත්, දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන මිල ගණන් ඉහළ නැංවීම සහ අවාර සමයේ දේශීය ආහාර සැපයුම මත ඇතිවූ පීඩනය හේතුවෙන් 2018 අගෝස්තු මාසයේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය සියයට 5.9 ක් දක්වා ඉහළ ගියේය. ඉන්පසු ආහාර උද්ධමනය අඩුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය 2018 සැප්තැම්බර් මාසයේදී සියයට 4.3 දක්වා මන්දගාමී විය. කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2017 වසර අවසානයේ වාර්තා වූ


**7.1 රූප සටහන**

**වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (ජාතික පාරිභෝගික මිල දර්ශකය)**




**7.2 රූප සටහන**

**වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කොළඹ පාරිභෝගික මිල දර්ශකය)**




සියයට 6.6 හා සාපේක්ෂව 2018 සැප්තැම්බර් මාසයේදී සියයට 5.4 ක් විය. සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා උද්ධමනය මැදිකාලීනව ඉලක්කගත සියයට 4-6 පරාසයේ පවතිනු ඇතැයි අපේක්ෂිතය.


- **ආර්ථිකයේ පවතින යටිදැරි ඉල්ලුම් පීඩන මනාව පාලනය කොට ඇති බව පෙන්නුම් කරමින් ඉල්ලුමෙන් ජනිත වන උද්ධමනය පිළිබිඹු කරනු ලබන මූලික උද්ධමනය 2018 වසරේ මේ දක්වා කාලය තුළදී අඩු මට්ටමක පැවතිණි.** සාපේක්ෂ වශයෙන් දැඩි මුදල් තත්ත්වයක් පැවතීම මෙන්ම, උද්ධමන අපේක්ෂා පාලනය වීම 2018 වසරේ පළමු මාස නවය තුළදී මූලික උද්ධමනය අඩුවීමට හේතු විය. ඒ අනුව, ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2018 සැප්තැම්බර් මාසයේදී සියයට 3.1 ක අඩු මට්ටමක පැවති අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය වාර්ෂික සාමාන්‍ය පදනම මත 2017 වසර අවසානයේ පැවති සියයට 4.9 සිට 2018 සැප්තැම්බර් මාසය වන විට සියයට 2.4 දක්වා අඩු විය. කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය ද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2017 වසර අවසානයේ පැවති සියයට 4.3 සිට 2018 සැප්තැම්බර් මාසයේදී සියයට 3.8 දක්වා මන්දගාමී වූ අතර, වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය ද 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 5.9 හා සාපේක්ෂව 2018 සැප්තැම්බර් මාසයේදී සියයට 3.9 දක්වා අඩු විය.

- **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරි දැක්මකින් යුතුව මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ප්‍රධාන පාර්ශ්වකරුවන් තුළ උද්ධමනය පිළිබඳ හිතකර ඉදිරි දැක්මක් පැවතීම පිළිබිඹු කරමින්, උද්ධමන අපේක්ෂා අඛණ්ඩව පාලනය වී පැවතිණි.** ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා 2018 වසරේ පළමු භාගය තුළදී සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතියද, පරිපාලිත මිල ගණන් සංශෝධනය වීම්, විශේෂයෙන්ම දේශීය ඛනිජ තෙල් මිල ගණන් සංශෝධනය සහ දේශීය විනිමය අවප්‍රමාණය වීමත් සමඟ උද්ධමනයේ හැසිරීම අනුව යමින් 2018 වසරේ තුන්වන කාර්තුවේදී උද්ධමන අපේක්ෂා ඉහළ යෑමක් දක්නට ලැබුණි. කුටුම්බ අංශයේ උද්ධමන අපේක්ෂා 2018 වසරේදී මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කළේය.

- **දේශීය සහ ගෝලීය ආර්ථිකය තුළ දැනට පවතින සහ අපේක්ෂිත වර්ධනයන් සැලකිල්ලට ගනිමින් 2018 වසරේ පළමු මාස නවය තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව පරීක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කළේය.** බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම රුපියල් තැන්පතු වගකීම මත වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය (SRR) ප්‍රතිශතාංක 1.50 කින් සියයට 7.50 දක්වා ඉහළ නංවමින් සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 125 කින් ඉහළ නංවමින් 2015 වසර අවසානයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගනු ලැබූ දැඩි

**7.3 රූප සටහන**

**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින්, විශේෂයෙන්ම ඉල්ලුමෙන් ජනිත වූ උද්ධමනය සහ මුදල් හා ණය සමස්තවල ප්‍රවණතා සම්බන්ධයෙන් වූ අපේක්ෂිත ප්‍රතිඵල ඉටු කරගනු ලැබිණ. මෙම වර්ධනයන් සහ විශේෂයෙන්ම, උද්ධමනය, උද්ධමන අපේක්ෂා සහ මුදල් අංශයේ ප්‍රවණතාවල හිතකර වර්ධනය මෙන්ම, මන්දගාමී ආර්ථික වර්ධන වාතාවරණය හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට යොමු විය. ඒ අනුව, 2018 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) සියයට 8.50 දක්වා පදනම් අංක 25 කින් අඩු කරන ලද අතර, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සියයට 7.25 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගනිමින් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පරාසය පදනම් අංක 150 සිට පදනම් අංක 125 දක්වා පටු කළේය. කෙසේ වුවද, ගෝලීය ආර්ථික තත්ත්ව සහ විනිමය අනුපාතිකය මත වූ පීඩනය හේතුවෙන් 2018 අප්‍රේල් මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළ අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව ඇතුළත බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට ඉහළ යෑම සඳහා ඉඩ සලසන ලදී.

- **ආර්ථික නියෝජිතයන්ට සඵලදායී තීරණ ගැනීම සඳහා අවකාශ සලසමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ මැදිකාලීන සාර්ව ආර්ථික දිශානතිය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දීමේ අරමුණ ඇතිව සිය ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගණනාවක් ගනු ලැබීය.** ආර්ථිකයේ ඉදිරි දැක්ම සහ ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්ති පිළිබඳ පුළුල් මගපෙන්වීමක් කරනු ලබන, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන සන්නිවේදන මාධ්‍යයක් ලෙස භාවිතා වන *ප්‍රතිපත්ති පෙරදැක්ම* 2018 වසර ආරම්භයේදී ප්‍රකාශයට පත් කෙරිණ. මුදල් ප්‍රතිපත්ති නිවේදනයට අදාළ පූර්ව නිවේදිත දින දර්ශනය ද *ප්‍රතිපත්ති පෙරදැක්ම* මගින් ප්‍රසිද්ධ කරනු ලැබිය. සාර්ව ආර්ථික පසුබිම සහ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා තුඩුදුන් සාධක පැහැදිලි කරනු ලබන මුදල් ප්‍රතිපත්ති නිවේදනය වැඩිදියුණු කරන ලද සහ ඉදිරි දැක්මක් සහිත මුදල් ප්‍රතිපත්ති විවරණයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති මුලසුන දරන සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මාධ්‍ය හමුවක් ද අඛණ්ඩව පවත්වනු ලැබීය. මීට අමතරව, පුවත්පත් නිවේදන, තොරතුරු සටහන්, ප්‍රකාශන, විවරණිකා සහ වෙනත් නිවේදන හරහා ප්‍රධාන සාර්ව ආර්ථික වර්ධනයන්ගේ නවතම තොරතුරු සහ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිතිපතා භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කළ අතර, මහ බැංකු වෙබ් අඩවිය ඔස්සේ සාර්ව ආර්ථික දත්ත සපයන ලදී. 2020 වසර වනවිට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදීන්ගේ දැනුම්වත් බව ඉහළ නැංවීම සඳහා විශේෂ සැසි වාරයක් ද ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වන ලදී.


## පොලී අනුපාතිකවල හැසිරීම

### වෙළඳපොළ ද්‍රවශීලතාව, වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සහ කෙටිකාලීන පොලී අනුපාතික

- **මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හා ගැළපෙන පරිදි එක්දින පොලී අනුපාතික හැසිරවීම සඳහා දේශීය මුදල් වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව යෝග්‍ය ලෙස විවට වෙළඳපොළ කටයුතුවල නිරත විය.** 2018 වසරේ පළමු මාස පහ තුළදී වෙළඳපොළ ද්‍රවශීලතාව සාමාන්‍යයෙන් රුපියල් බිලියන 20 ක පමණ අතිරික්තයක පැවති අතර, ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම සහ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම ප්‍රධාන වශයෙන් හේතු විය. අතිරික්ත

**7.4 රූප සටහන**

**දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සහ ද්‍රවශීලතා කළමනාකරණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ද්‍රවශීලතාව යෝග්‍ය ලෙස මෙහෙයවීම සඳහා මෙම කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව එක්දින, කෙටිකාලීන මෙන්ම දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු සිදු කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් නියමිත කල්පිරීමේ කාලයට පෙර අලෙවි කිරීම මෙන්ම, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විදේශ විනිමය විකිණීමෙහි ප්‍රතිඵලයක් ලෙස වසරේ ජුනි මස සිට ජූලි මස මැද දක්වා කාලය තුළදී දේශීය මුදල් වෙළඳපොළ තුළ ද්‍රවශීලතා හිඟයක් වාර්තා විය. ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක් දක්වා 2018 ජූලි මස මැදදී තාවකාලිකව ඉහළ ගියද, 2018 සැප්තැම්බර් මස අවසාන කාලයේදී වෙළඳපොළ ද්‍රවශීලතාව නැවතත් හිඟ මට්ටමක පැවතිණි. ශ්‍රී ලංකා මහ බැංකුව රජය සමඟ එළැඹි ඉදිරි ගනුදෙනු කල්පිරීම, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් කල්පිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම් මේ සඳහා හේතු විය. 2018 සැප්තැම්බර් මස අවසානය වන විට එක්දින වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය රුපියල් බිලියන 57.7 ක් විය. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ මට්ටමට ආසන්නව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු කළ අතර, එක්දින, කෙටිකාලීන සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු මෙන්ම, භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත මිලදී ගැනීම තුළින් වෙළඳපොළ සහභාගිවන්නන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරාලන ලදී.

- **වෙළඳපොළ ද්‍රවශීලතාව වෙනස් වීම මත එක්දින පොලී අනුපාතික මිශ්‍ර හැසිරීම් පෙන්නුම් කළේය.** රජය විසින් රඳවා ගැනීමේ බදු සංශෝධනය කිරීමේ බලපෑම වාණිජ බැංකු මගින් වැරදි ලෙස අර්ථකථනය කිරීම හේතුවෙන් මාර්තු මාසය අවසානයේදී කිසියම් තාවකාලික ඉහළ යෑමක් වාර්තා කරනු ලැබුවද, 2018 වසරේ පළමු මාස තුන තුළදී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය බොහෝ විට ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ මධ්‍යයට ආසන්නව අඛණ්ඩව පැවතිණි. කෙසේ වෙතත්, 2018 අප්‍රේල් මාසය මුලදී නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පහත හෙළීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඩු වී 2018 මැයි මස අවසානය වන තෙක් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව මධ්‍යයේ රැඳී පැවතිණි. 2018 ජුනි මාසය මුල සිට දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති ද්‍රවශීලතා හිඟයට ප්‍රතිචාර දක්වමින් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉහළ ගොස්, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ආසන්නයේ පැවතිණි. කෙසේ වෙතත්, 2018 ජූලි මස මැද සිට ද්‍රවශීලතා තත්ත්වය අතිරික්තයක් දක්වා ඉහළ යෑම හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නැවතත් 2018 අගෝස්තු සිට සැප්තැම්බර් මස මැද දක්වා කාලසීමාව තුළදී ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ මැද දක්වා අඩු විය. 2018 සැප්තැම්බර් මාසයේ තෙවන සතියේ සිට ද්‍රවශීලතා හිඟයක් වාර්තා කිරීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉහළ ගොස් 2018 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 8.40 ක් ලෙස වාර්තා විය. තවද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි හැසිරීමට අනුව 2018 වසරේ පළමු මාස නවය තුළදී දෛනික විවට වෙළඳපොළ කටයුතු වෙන්දේසිවල බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික සහ එක්දින අන්තර් බැංකු අර්පණ අනුපාතික ද විචලනය විය. එක්දින සහ මාස 12 සඳහා වන ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික 2017 වසර අවසානයේ පැවති සියයට 8.15 සහ සියයට 12.18 හා සැසඳීමේදී 2018 සැප්තැම්බර් මස අවසානය වන විට, පිළිවෙළින්, සියයට 8.35 ක් හා සියයට 11.50 ක් විය.


### රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

- **වෙළඳපොළ අපේක්ෂා වෙනස්වීම් මෙන්ම, රජයේ අරමුදල් අවශ්‍යතා සහ විදේශ මූල්‍ය ලැබීම් පිළිබිඹු කරමින් 2018 පළමු මාස නවය තුළදී රජයේ**

7

**7.5 රූප සටහන**

**භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික (අ)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ලංසු පිළිගත නොහැකි වීම හෝ අදාළ පරිණත කාලය සඳහා සුරැකුම්පත් නිකුතු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇතැම් සති සඳහා ඵලදා අනුපාතික වාර්තා නොවේ


**සුරැකුම්පත් වෙළඳපොළෙහි ඵලදා අනුපාතික මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කළේය.** විදේශ අරමුදල් ලැබීම් ප්‍රමාද වීමත් සමඟ රජයේ අරමුදල් අවශ්‍යතාව ඉහළ යෑම පිළිබිඹු කරමින්, 2018 පළමු කාර්තුව තුළදී ප්‍රාථමික වෙළඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එතැන් සිට ඵලදා අනුපාතිකවල යම් ස්ථායීවීමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළෙහි පැවති දැඩි මූල්‍ය තත්ත්වයන් හමුවේ විදේශීය ආයෝජකයන් විසින් රජයේ සුරැකුම්පත් මත සිදු කොට තිබූ ආයෝජන ඉවත්කර ගැනීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යෑමක් 2018 මැයි මාසයේ දී දක්නට ලැබුණි. ප්‍රාථමික වෙන්දේසිවල පොලී අනුපාතික අඩු වීම මගින් පෙන්නුම් කළ පරිදි 2018 ජූලි මස සිට අගෝස්තු මාසය දක්වා අතර කාලය තුළදී ඵලදා අනුපාතික ඉහළ යෑමේ පීඩනය යම් පමණකට අඩු වුවද, ප්‍රාග්ධන ප්‍රවාහ රටින් පිටතට ගලා යෑම හමුවේ පැවති අහිතකර වෙළඳපොළ අපේක්ෂා සහ දැඩි ද්‍රවශීලතා තත්ත්ව හේතුවෙන් 2018 සැප්තැම්බර් මාසයේදී භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික ඉහළ යෑමක් පෙන්නුම් කළේය. 2017 වසර අවසානය හා සැසඳීමේදී 2018 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා කාලය තුළදී දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික, පිළිවෙළින්, පදනම් අංක 87, පදනම් අංක 30 සහ පදනම් අංක 61 වශයෙන් සියයට 8.56, සියයට 8.60 සහ සියයට 9.51 දක්වා ඉහළ ගියේය.

- 2018 වසරේ පළමු මාස නවය තුළදී ප්‍රාථමික වෙළඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කර මත ඵලදා අනුපාතික ද මිශ්‍ර හැසිරීම් පෙන්නුම් කළේය. භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතිකවල හැසිරීම හා සමාන හැසිරීමක් පෙන්නුම් කරමින් 2018 පළමු කාර්තුව තුළදී භාණ්ඩාගාර බැඳුම්කර මත ඵලදා අනුපාතික ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ඉන්පසුව වෙළඳපොළ අපේක්ෂා අනුව භාණ්ඩාගාර බැඳුම්කර මත ඵලදා අනුපාතික මිශ්‍ර හැසිරීම් පෙන්නුම් කළේය. 2018 වසරේ පළමු මාස නවය තුළදී රජය විසින් කෙටි සහ මැදිකාලීන භාණ්ඩාගාර බැඳුම්කර වැඩි වශයෙන් නිකුත් කරන ලද අතර, එම කාලසීමාව තුළදී වසර 10 සහ වසර 15 ක දිගුකාලීන කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කරද නිකුත් කෙරිණි. මේ අතර, රජය විසින් කෙටිකාලීන හා මැදිකාලීන පදනම මත වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ස්ථාවර හා විචල්‍ය පොලී අනුපාතික සහිතව නිකුත් කරන ලදී. 2018 සැප්තැම්බර් මස පවත්වන ලද වෙන්දේසියේදී, වසරක හා මාස 8 සහ වසර 3 හා මාස 8 ක කාලසීමා සහිත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, පිළිවෙළින්, සියයට 5.00 සහ සියයට 5.75 ක ස්ථාවර අනුපාතික යටතේ නිකුත් කර ඇත. තවද, 2018 අප්‍රේල් මාසයේදී වසර 5 ක සහ වසර 10 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, පිළිවෙළින්, සියයට 5.75 සහ සියයට 6.75 ක අනුපාතික යටතේ නිකුත් කරන ලදී.

- 2017 වසර අවසානය හා සාපේක්ෂව 2018 සැප්තැම්බර් මාසය අවසානය වන විට රජයේ සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය ඉහළට විතැන් විය. මෙම ඉහළ

**7.6 රූප සටහන**

**රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 7.1 සංඛ්‍යා සටහන
### පොලී අනුපාතිකවල හැසිරීම්

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

| පොලී අනුපාතිකය | 2017 වසර අවසානයට | 2018 සැප්තැම්බර් අවසානයට |
|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.75 | 8.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය** | 8.15 | 8.40 |
| **රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික** | | |
| ප්‍රාථමික වෙළඳපොළ (අ) | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | |
| දින 91 | 7.69 | 8.56 |
| දින 182 | 8.30 | 8.60 |
| දින 364 | 8.90 | 9.51 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | |
| වසර 2 | 9.83 | - |
| වසර 3 | 9.55 | 10.03 |
| වසර 4 | 11.14 | - |
| වසර 5 | 10.20 | 9.91 |
| වසර 10 | 10.36 | 10.20 |
| **ද්විතීයික වෙළඳපොළ** | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | |
| දින 91 | 7.68 | 8.45 |
| දින 182 | 8.30 | 8.88 |
| දින 364 | 8.89 | 9.41 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | |
| වසර 2 | 9.37 | 9.77 |
| වසර 3 | 9.68 | 10.41 |
| වසර 4 | 9.81 | 10.55 |
| වසර 5 | 9.96 | 10.67 |
| වසර 10 | 10.15 | 10.86 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු (ආ)** | | |
| ***තැන්පතු පොලී අනුපාතික*** | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.50-9.50 | 0.50-8.50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඇ) | 4.89-15.00 | 4.53-15.00 |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (ඈ) | 9.07 | 8.69 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඈ) | 11.48 | 10.84 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (ඈ) | 10.06 | 10.24 (ඉ) |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඈ) | 10.65 | 10.69 (ඉ) |
| ***ණය පොලී අනුපාතික*** | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය | 11.33 | 11.72 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 13.88 | 14.18 (ඉ) |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 14.31 | 14.35 (ඉ) |
| **අනෙකුත් මූල්‍ය ආයතන (ඊ)** | | |
| ***තැන්පතු පොලී අනුපාතික*** | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.00 | 4.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 11.00 | 10.50 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (උ) | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 5.43-7.99 | 5.26-7.95 (ඉ) |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.15-13.71 | 11.50-13.09 (ඉ) |
| ***ණය පොලී අනුපාතික*** | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 13.00-16.00 | 12.75-16.00 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ඌ) | 10.50-20.00 | 10.50-20.00 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (උ) | | |
| මූල්‍ය කල්බදු | 17.40-28.03 | 16.89-29.96 (ඉ) |
| කුලීපිට ගැනුම් | 15.00-20.84 | 13.80-22.43 (ඉ) |
| නිශ්චල දේපළ මත ලබා දුන් ණය | 17.95-20.18 | 18.82-21.27 (ඉ) |
| **සාංගමික ණය වෙළඳපොළ** | | |
| ණයකර | 12.50-15.00 | 12.00-14.20 (ඉ) |
| වාණිජ පත්‍රිකා | 13.75-16.50 | 13.10-15.00 |

(අ) ආසන්නතම වෙන්දේසියේදී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික.
(ආ) වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඇ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.
(ඈ) රජයේ අනුමැතිය මත ලබා දෙන සියයට 15 ක් වූ ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ ස්ථාවර තැන්පතු අනුපාතිකයෙහි බලපෑම ඉවත් කිරීම සඳහා 2018 වසරේ ජූලි මස සිට බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ වෙළඳපොළ පොලී අනුපාතික මඟිනි. 2018 ජූනි මස සිට බරිත සාමාන්‍ය නව අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කිරීම සඳහා මෙම ක්‍රියාදාමයම භාවිතා වේ.
(ඉ) 2018 අගෝස්තු මාසය අවසාන වන විට.
(ඊ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(උ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාල මාසයේදී තැන්පතු නැවත ලබා ගැනීම සහ ණය ලබා දීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2018 වසර සඳහා දත්ත තාවකාලික වේ.
(ඌ) නිවාස කටයුතු සඳහා දෙන ණය පමණි.


මූලයන්: කොළඹ කොටස් හුවමාරුව
අදාළ මූල්‍ය ආයතන
ශ්‍රී ලංකා මහ බැංකුව

යැම සඳහා ඇඩි මුදල් තත්ත්ව මධ්‍යයේ පැවති වෙළඳපොළ අපේක්ෂා හේතු විය. දින 91, දින 182 සහ දින 364 ද්විතීයික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික 2017 වසර අවසානයේ පැවති අනුපාතික හා සැසඳීමේදී 2018 සැප්තැම්බර් මාසය අවසානය වන විට, පිළිවෙළින්, පදනම් අංක 77 කින්, පදනම් අංක 58 කින් සහ පදනම් අංක 51 කින් සියයට 8.45, සියයට 8.88 සහ සියයට 9.41 දක්වා ඉහළ ගියේය. 2017 වසර අවසානයේ දක්නට ලැබුණු ඵලදා අනුපාතික හා සැසඳීමේදී 2018 සැප්තැම්බර් මාසය අවසානය වන විට සියලුම කල්පිරීම් කාලසීමා සහිත භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ද පදනම් අංක 29 සිට 74 දක්වා පරාසයකින් ඉහළ ගියේය.

## තැන්පතු සහ ණය පොලී අනුපාතික

- **වාණිජ බැංකුවල බොහොමයක් තැන්පතු පොලී අනුපාතික වසරේ පළමු මාස නවය තුළදී ඉහළ මට්ටමක පැවතිණි.** 2018 සැප්තැම්බර් මාසය තුළදී තැන්පතු පොලී අනුපාතිකවල ඉහළ යැමක් පිළිබිඹු වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික 2018 අප්‍රේල් මාසයේදී පහත හෙළීම හේතුවෙන් තැන්පතු පොලී අනුපාතික ක්‍රමයෙන් අඩු වීමක් සිදු විය. වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතිකවල හැසිරීම පිළිබිඹු කරනු ලබන බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය 2017 වසර අවසානයේ පැවති සියයට 9.07 සිට 2018 සැප්තැම්බර් අවසානය වන විට සියයට 8.69 දක්වා පදනම් අංක 38 කින් අඩු විය. මේ අතර, වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන කාලීන තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වූ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ද 2017 වසර අවසානයේ පැවති සියයට 11.48 සිට 2018 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 10.84 ක් දක්වා පදනම් අංක 64 කින් පහළ ගියේය. කෙසේ වුවද, විශේෂයෙන්ම වෙළඳපොළ තුළ හිඟ ද්‍රවශීලතා තත්ත්වයක් පැවතීම හේතුවෙන් තැන්පතු රැස්කර ගැනීම සඳහා බැංකු විසින් දරන ලද උත්සාහයේ බලපෑම පිළිබිඹු කරමින්, වාණිජ බැංකු විසින් රැස්කරන ලද සියලුම නව තැන්පතුවලට අදාළ පොලී අනුපාතිකවල හැසිරීම නිරූපණය කරනු ලබන බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය 2017 වසර අවසානයේ පැවති සියයට 10.06 සිට 2018 අගෝස්තු මස අවසානය වන විට සියයට 10.24 දක්වා

**7.7 රූප සටහන**
**තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පදනම් අංක 18 කින් ඉහළ ගියේය. මේ අතර, මෙම කාලසීමාව තුළදී බොහෝ බැංකු විසින් පිරිනමන ලද තැන්පතු පොලී අනුපාතික හා සැසඳීමේදී පහළ මට්ටමක වූ උද්ධමනය තුළින් මූර්ත පොලී අනුපාතික ධන මට්ටමක පැවතීම හේතුවෙන් තැන්පත්කරුවන්ට අඛණ්ඩව ප්‍රතිලාභ හිමි විය.

- **2018 වසරේ පළමු මාස නවය තුළදී වාණිජ බැංකුවල ණය පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ ගියේය.** කෙටිකාලීන ණය අනුපාතිකවල වෙනස්වීම පිළිබිඹු කරමින්, වාණිජ බැංකු විසින් සිය ප්‍රමුඛ ගනුදෙනුකරුවන් වෙත සපයන ලද කෙටිකාලීන ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම්ව සතිපතා ගණනය කරනු ලබන බරිත සාමාන්‍ය

**7.8 රූප සටහන**
**නව තැන්පතු සහ නව ණය අනුපාතික**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රමුඛ ණය අනුපාතිකය, ඇතැම් සතිවලදී අඩු වීමක් වාර්තා කළ ද, 2017 වසර අවසානයේ පැවති සියයට 11.55 හා සැසඳීමේදී 2018 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 11.74 ක් දක්වා පදනම් අංක 19 කින් ඉහළ ගියේය. සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකයෙහි මාසික සාමාන්‍යය මගින් ගණනය කරනු ලබන මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය 2017 වසර අවසානයේ වාර්තා කරන ලද සියයට 11.33 හා සැසඳීමේදී 2018 සැප්තැම්බර් මාසය අවසානය වන විට සියයට 11.72 ක් විය. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද සියලුම ණය සහ අත්තිකාරම් සඳහා අදාළ පොලී අනුපාතික මත පදනම් වූ බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය 2017 වසර අවසානයේ පැවති සියයට 13.88 සිට 2018 අගෝස්තු මාසය අවසානය වන විට සියයට 14.18 ක් දක්වා පදනම් අංක 30 කින් ඉහළ ගියේය. මේ අතර, සලකා බලනු ලබන මාසයක කාලයක් තුළ වාණිජ බැංකු විසින් සපයන ලද නව ණය සහ අත්තිකාරම්වලට අදාළ බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය 2017 දෙසැම්බර් මස අවසානයේ පැවති සියයට 14.31 සිට 2018 අගෝස්තු මස අවසානය වන විට සියයට 14.35 ක් දක්වා පදනම් අංක 4 කින් ඉහළ ගියේය. නාමික පොලී අනුපාතික හා සැසඳීමේදී උද්ධමනය පහළ මට්ටමක පැවතීම හේතුවෙන් බොහෝ මූර්ත ණය පොලී අනුපාතිකවල ඉහළ යෑමක් වාර්තා විය.

## සාංගමික ණය උපකරණ මත පොලී අනුපාතික

- **2018 වසරේ පළමු මාස අට තුළදී සාංගමික ණය සුරැකුම් මත පොලී අනුපාතික පහළ ගියේය.** කෙටිකාලීන ණය උපකරණයක් වන වාණිජ පත්‍රිකාවලට අදාළ පොලී අනුපාතික 2017 වසර තුළදී පැවති සියයට 13.75-16.50 පරාසය හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස අට තුළදී සියයට 13.10-15.00 ක පරාසයක් දක්වා අඩු විය. මෙම කාලසීමාව තුළදී සමාගම් හතකට අදාළ ණයකර නිකුතු 20 ක් වාර්තා වූ අතර, එම ණයකර වසර 4 සිට 10 දක්වා පරිණත කාලසීමාවන්ගෙන් යුතු ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාතිකවලින් සමන්විත විය. ස්ථාවර පොලී අනුපාතික යටතේ නිකුත් කරන ලද ණයකර සඳහා 2017 වසරේ වාර්තා වූ සියයට 12.50-15.00 ක් වූ පොලී අනුපාතික පරාසය හා සැසඳීමේදී 2018 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට එම පොලී අනුපාතික සියයට 12.00-14.20 අතර පරාසයක පැවතිණි.

### විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික

- **වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතික, 2018 වසරේ පළමු මාස නවය තුළදී මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කළේය.** එ.ජ. ඩොලර්වලින් පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීමේ තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී අනුපාතික 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 0.02-4.38 පරාසය හා සැසඳීමේදී 2018 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 0.02-4.00 පරාසයක පැවතිණි. එ.ජ. ඩොලර්වලින් පවත්වා ගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2017 වසර අවසානයේ පැවති සියයට 0.15-5.03 පරාසය හා සැසඳීමේදී 2018 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 0.15-6.00 පරාසයේ පැවතිණි. මේ අතර, ස්ටර්ලින් පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන ඉතිරිකිරීමේ තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 0.10-2.25 පරාසය හා සැසඳීමේදී 2018 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 0.10-2.47 පරාසයක විය. 2017 වසර අවසානයේ පැවති සියයට 0.20-4.57 පරාසය හා සැසඳීමේදී ස්ටර්ලින් පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2018 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 0.10-3.25 පරාසයක පැවතිණි.


### මුදල් සහ ණය සමස්තවල හැසිරීම

#### සංචිත මුදල්

- **2018 වසරේ පළමු මාස අට තුළදී සංචිත මුදල් මන්දගාමී ලෙස වර්ධනය විය.** 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 9.8 ක වර්ධනය හා සැසඳීමේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සංචිත මුදල් වර්ධනය 2018 අගෝස්තු මස අවසානය වන විට සියයට 10.2 ක් විය. ඒ අනුව, 2017 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ රුපියල් බිලියන 55.2 ක ප්‍රසාරණය හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස අට තුළදී සංචිත මුදල් රුපියල් බිලියන 1,004.7 ක් දක්වා රුපියල් බිලියන 64.9 කින් ඉහළ ගියේය. මහ බැංකුවේ වගකීම් ඇසුරින් සංචිත මුදල් සැපයුම සැලකූ විට, මෙම කාලසීමාව තුළදී සංචිත මුදල් සැපයුමෙහි වර්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ

**7.9 රූප සටහන**

**දෛනික සංචිත මුදල් (අ)**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2016 ජනවාරි මාසය තුළ සංචිත මුදල්වල ක්ෂණික වෙනස් වීම සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි සිදු කරන ලද සංශෝධන හේතු වූ අතර අප්‍රේල් හා දෙසැම්බර් කාල සීමා තුළ සංචිත මුදල්වල ක්ෂණික වෙනස් වීම් සඳහා කාලීන ඉල්ලුම් සාධක හේතුවිය.

යෑම මෙන්ම, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ඉහළ යෑමද හේතු විය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 385.0 ක් දක්වා රුපියල් බිලියන 43.3 කින් ඉහළ ගියේය. 2017 වසර අවසානයේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වාර්තා කළ සියයට 12.7 ක වර්ධනය හා සැසඳීමේදී වාණිජ බැංකු සතු තැන්පතු 2018 අගෝස්තු මස අවසානය වන විට සියයට 16.8 ක වර්ධනයක් වාර්තා කළේය. පොලී අනුපාතික ඉහළ මට්ටමක පවතින තත්ත්වයක් තුළ මුදල් ළඟ තබාගැනීමේ ඉහළ ආවස්ථික පිරිවැය පිළිබිඹු කරමින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල්, 2017 වසර අවසානයේ පැවති සියයට 8.2 ක වර්ධනය හා සැසඳීමේදී 2018 අගෝස්තු මාසය අවසානය වන විට සියයට 6.5 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් 2018 අගෝස්තු මාසය අවසානය වන විට රුපියල් බිලියන 619.6 ක් දක්වා රුපියල් බිලියන 21.5 කින් ඉහළ ගියේය.

- **ශ්‍රී ලංකා මහ බැංකු ශේෂ පත්‍රයේ වත්කම් අනුව සලකා බැලීමේදී, 2018 වසරේ පළමු මාස අට තුළදී සංචිත මුදල් වර්ධනය සඳහා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් මෙන්ම ශුද්ධ විදේශීය වත්කම් ද දායක වී ඇත.** 2017 වසර තුළදී වාර්තා වූ රුපියල් බිලියන 203.9 ක සැලකිය යුතු අඩු වීම හා සැසඳීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්, 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන

7

103.2 ක් දක්වා රුපියල් බිලියන 9.6 කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ යෑම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2017 වසර තුළදී වාර්තා වූ රුපියල් බිලියන 187.9 ක අඩු වීම හා සැසඳීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය, 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 245.8 ක් දක්වා රුපියල් බිලියන 20.7 කින් ඉහළ ගියේය. 2018 වසරේ පළමු මාස අට තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 24.9 කින් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් හැර) රුපියල් බිලියන 4.2 කින් පහළ ගියේය. තවද, මහ බැංකුවේ අනෙකුත් වත්කම් සහ අනෙකුත් වගකීම්වල වෙනස මගින් පිළිබිඹු වන මහ බැංකුවේ අනෙකුත් අයිතමවල (ශුද්ධ) අගය ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර සංචිත ප්‍රත්‍යාගණන ඉපැයීම් ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 5.5 කින් පහළ ගියේය. 2017 වසරේ වාර්තා කරන ලද රුපියල් බිලියන 287.5 ක සැලකිය යුතු ඉහළ යෑම හා සැසඳීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 55.3 කින් ඉහළ යෑමද, සංචිත මුදල් වර්ධනය සඳහා හේතු විය. විදේශ මූල්‍ය වගකීම්, විශේෂයෙන්ම ජාත්‍යන්තර ආයතන වෙතැති වගකීම් ප්‍රමාණය ඉහළ ගියද, විදේශ සුරැකුම්පත් මත ආයෝජන ඉහළ යෑම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් වර්ධනය සඳහා හේතු විය. කෙසේ වෙතත්, සලකා බලන කාලසීමාව තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ මූල්‍ය වගකීම් වර්ධනයට වඩා විදේශ මූල්‍ය වත්කම් වර්ධනය වී ඇත.

## පටු මුදල් සැපයුම ($M_1$)

7


- **මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන මහජනයා සතු ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත පටු මුදල් ඉහළ පොලී අනුපාතිකවල බලපෑමත් සමඟ, 2017 වසර අවසානයේ පැවති සියයට 2.1 ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය හා සැසඳීමේදී 2018 අගෝස්තු මාසය අවසානය වන විට සියයට 4.3 කින් මන්දගාමී ලෙස වර්ධනය විය.** 2018 වසරේ පළමු මාස අට තුළදී පටු මුදල් වර්ධනය සඳහා මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් ඉහළ යෑම හේතු විය. ඒ අනුව, පටු මුදල් සැපයුමේ වර්ධනය සඳහා සියයට 62 කින් පමණ දායක වෙමින් මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්, 2017 වසර අවසානයේ වාර්තා කළ සියයට 2.3 ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස අට තුළදී සියයට 4.6 කින් වර්ධනය විය. මේ අතර, ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික පවතින වාතාවරණයක් තුළ පොලී රහිත තැන්පතු සඳහා පවතින අඩු ඉල්ලුම පිළිබිඹු කරමින් මහජනයා සතු වාණිජ බැංකු වෙතැති ඉල්ලුම් තැන්පතු, 2018 පළමු මාස අට තුළදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.8 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, මහජනයා සතු වාණිජ බැංකු වෙතැති ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය 2017 වසර අවසානයේ වාර්තා කළ රුපියල් බිලියන 353.9 සිට 2018 අගෝස්තු මාසය අවසානය වන විට රුපියල් බිලියන 329.8 ක් දක්වා රුපියල් බිලියන 24.1 කින් අඩු විය.

## පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) සහ දේශීය ණය

- **පසුගිය කාලසීමාව තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි බලපෑම හේතුවෙන් 2018 වසර තුළදී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනය අඛණ්ඩව මන්දගාමී විය.** 2017 වසර අවසානයේ වූ සියයට 16.7 හා සැසඳීමේදී 2018 අගෝස්තු මාසය අවසානය වන විට පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 13.5 ක් වූ අතර, පුළුල් මුදල් සැපයුමේ සාමාන්‍ය වර්ධනය 2017 වසරේ පළමු මාස අට තුළ වූ සියයට 20.1 හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස අට තුළදී සියයට 15.4 ක් විය. පෞද්ගලික අංශය වෙත

**7.10 රූප සටහන**

**පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා දායක වූ ප්‍රධාන සාධක (වත්කම් අංශය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සපයන ලද ණය වර්ධනය අඛණ්ඩව මන්දගාමී වීම පුළුල් මුදල් වර්ධනය අඩුවීම සඳහා ප්‍රධාන සාධකය විය. 2018 වසරේ පළමු මාස අට තුළ පුළුල් මුදල් වර්ධනය සඳහා බැංකු අංශය සතු ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය මෙන්ම, ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය ද හේතු විය. 2018 වසරේ පළමු මාස අට තුළදී පුළුල් මුදල් සමස්තයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා ශුද්ධ දේශීය වත්කම් සියයට 73 කින් දායක වූ අතර, ශුද්ධ විදේශීය වත්කම් සෙසු ප්‍රතිශතය සඳහා දායක විය.

- **වගකීම් අංශයෙන් සැලකු කල, පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රසාරණය සඳහා වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන මහජනයා සතු කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතුවල ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.** ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික හේතුවෙන් මෙම කාලසීමාව තුළදී කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු සැලකිය යුතු ප්‍රමාණයක් වාණිජ බැංකු වෙත ආකර්ෂණය වූ අතර, පුළුල් මුදල් සැපයුමෙහි සමස්ත ප්‍රසාරණය සඳහා එය සියයට 96 ක පමණ දායකත්වයක් සැපයීය. 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 19.1 හා සැසඳීමේදී කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු 2018 අගෝස්තු මාසය අවසානයේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 14.8 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රුපියල් බිලියන 662.5 ක ඉහළ යෑම හා සැසඳීමේදී වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 560.1 කින් ඉහළ ගියේය.

- **වත්කම් අංශය සැලකූ විට,** 2018 වසරේ පළමු **මාස අට තුළ බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම මුළුමනින්ම හේතු විය.** 2018 වසරේ පළමු මාස අට තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 55.4 කින් ප්‍රසාරණය වීම හේතුවෙන් බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 45.3 කින් ඉහළ ගියේය. මේ අතර, දේශීය බැංකු ඒකක සතු ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 23.1 කින් පහළ යෑමත් සමඟ 2018 වසරේ පළමු මාස අට තුළ වාණිජ බැංකු සතු ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 10.0 කින් පහළ ගියේය. විදේශීය බැංකු ඒකකවල පවත්වා ගෙන යනු ලබන විදේශ විනිමය තැන්පතු ඉහළ යෑමත් සිදු වුවද, වාණිජ බැංකු සතු

**7.11 රූප සටහන**

**බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනේවාසිකයන්ගේ විදේශ විනිමය තැන්පතු වගකීම් ඉහළ යෑම හේතුවෙන් දේශීය බැංකු ඒකක සතු ශුද්ධ විදේශීය වත්කම් ප්‍රමාණය පහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ, මූල්‍ය වත්කම්වලට සාපේක්ෂව මූල්‍ය වගකීම් පහළ යෑම හේතුවෙන් අක්වෙරළ බැංකු ඒකක සතු ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 13.1 කින් ඉහළ ගියේය. අනේවාසිකයන් වෙත සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑමක් සිදුවූ අතර, විදේශ බැංකු වෙත වූ තැන්පතු පහළ යෑම හේතුවෙන් අක්වෙරළ බැංකු ඒකක සතු විදේශ වත්කම් සුළු වශයෙන් පහළ ගියේය. අනේවාසිකයන්ගේ තැන්පතු ඉහළ යෑම මධ්‍යයේ වුවද විදේශ බැංකු වෙතින් සිදු කෙරෙන ණය ගැනීම් පහළ යෑම හේතුවෙන් විදේශ වගකීම් පහළ ගියේය.

- **රජය සහ පෞද්ගලික අංශ වෙත ණය සැපයීම ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ පළමු මාස අට තුළ බැංකු අංශයෙහි ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය විය.** ඒ අනුව, 2017 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ රුපියල් බිලියන 463.8 ක ඉහළ යෑමට සාපේක්ෂව බැංකු අංශයෙහි ශුද්ධ දේශීය වත්කම් 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 513.0 කින් ඉහළ ගියේය.

- **රජයේ ණය ගැනීම් කටයුතුවල කිසියම් වැඩි දියුණුවීමක් පෙන්නුම් කරමින්** 2018 වසරේ පළමු **මාස අට තුළදී බැංකු අංශය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණයේ ප්‍රසාරණය අඩු මට්ටමක පැවතිණි.** 2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ

7

**7.2 සංඛ්‍යා සටහන**

**දේශීය ණය ප්‍රසාරණය සහ දායකත්ව සාධක**

| කාලපරිච්ඡේදය | වෙනස (රු. බිලියන) | | | | දේශීය ණය සඳහා දායකත්වය (%) | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය ණය (අ) | පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය (ආ) | රජය වෙත සපයන ලද ශුද්ධ ණය | රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය (ආ) | පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය (ආ) | රජය වෙත සපයන ලද ශුද්ධ ණය | රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය (ආ) |
| 2014 | 439.4 | 219.0 | 134.6 | 85.8 | 49.8 | 30.6 | 19.5 |
| 2015 | 1,091.9 | 688.6 | 323.6 | 79.7 | 63.1 | 29.6 | 7.3 |
| 2016 | 939.6 | 743.9 | 212.6 | -16.9 | 79.2 | 22.6 | -1.8 |
| 2017 | 833.0 | 613.4 | 196.4 | 23.2 | 73.6 | 23.6 | 2.8 |
| ජන - අගෝ 2017 | 677.8 | 404.7 | 265.4 | 7.7 | 59.7 | 39.2 | 1.1 |
| **ජන - අගෝ 2018** | **655.1** | **449.1** | **103.4** | **102.5** | **68.6** | **15.8** | **15.6** |

(අ) දේශීය ණය තුළ පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය, රජය වෙත ලබාදුන් ශුද්ධ ණය සහ රාජ්‍ය සංස්ථා වෙත ලබාදුන් ණය අන්තර්ගත වේ.
(ආ) සංශෝධිත

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් බිලියන 265.4 ක ඉහළ යෑම හා සැසඳීමේදී බැංකු අංශය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 103.4 කින් ඉහළ ගියේය. 2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රුපියල් බිලියන 119.5 ක අඩුවීම හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස අට තුළදී මහ බැංකුව විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 20.7 කින් ඉහළ ගියේය. 2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රුපියල් බිලියන 384.9 ක සැලකිය යුතු ඉහළ යෑම හා සැසඳීමේදී වාණිජ බැංකු විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය, 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 82.7 කින් පමණක් ඉහළ ගියේය. 2018 වසරේ පළමු මාස අට තුළදී වාණිජ බැංකු විසින් රජයට සපයන ලද ණය ප්‍රමාණයෙහි ඉහළ යෑම සඳහා දේශීය බැංකු ඒකක විසින් රජයට සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑම මුළුමනින්ම හේතු වූ අතර, අක්වෙරළ බැංකු ඒකක මගින් රජයට සැපයූ ණය ප්‍රමාණය අඩු විය. 2017 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ රුපියල් බිලියන 322.1 ක ඉහළ යෑමට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස අට තුළදී දේශීය බැංකු ඒකක විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණයෙහි වැඩිවීම රුපියල් බිලියන 92.1 ක් වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර යනාදියෙහි සිදු කරන ලද ආයෝජන හේතු විය. මේ අතර, මෙම කාලය තුළ, වාණිජ බැංකුවල පවත්නා රජයේ නොපියවූ අයිරා ශේෂය සහ රජය වෙත ලබාදුන් දේශීය ව්‍යවහාර මුදල් ණය, පිළිවෙළින්, රුපියල් බිලියන 19.6 කින් සහ රුපියල් බිලියන 3.4 කින් ඉහළ ගියේය. 2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රුපියල් බිලියන 62.2 ක ඉහළ යෑම හා සැසඳීමේදී අක්වෙරළ බැංකු ඒකක විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 9.4 කින් පහළ ගියේය. මෙම ණය ප්‍රමාණයෙහි පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල සිදු කළ ආයෝජනය පහළ යෑම හේතු විය.


- **ප්‍රධාන රාජ්‍ය ව්‍යවසාය කිහිපයක්ම සිය දුර්වල මූල්‍ය ක්‍රියාකාරිත්වය හේතුවෙන් වාණිජ බැංකු වෙතින් වැඩි වශයෙන් ණය ගැනීම පිළිබිඹු කරමින් 2018 වසරේ පළමු මාස අට තුළදී රාජ්‍ය සංස්ථාවලට සපයන ලද ණය ප්‍රමාණය විශාල වශයෙන් වර්ධනය විය.** 2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රුපියල් බිලියන 7.7 ක ඉහළ යෑම හා සැසඳීමේදී රාජ්‍ය සංස්ථාවලට සපයන ලද ණය ප්‍රමාණය 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 102.5 කින් ඉහළ ගියේය. 2018 වසරේ පළමු මාස අට තුළ රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑම සඳහා රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන් කිහිපයක් වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබාගත් රුපියල් බිලියන 42.3 ක සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබාගත් රුපියල් බිලියන 39.4 ක ණය ප්‍රමාණය ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම කාලපරිච්ඡේදය තුළදී, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රීලංකන් ගුවන් සමාගම, සමූපකාර තොග වෙළඳ සංස්ථාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාගත් ණය ප්‍රමාණය ද ඉහළ ගියේය. මේ අතර, 2018 වසරේ පළමු මාස අට තුළදී, සීමාසහිත ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, පිළිවෙළින්, රුපියල් බිලියන 5.0 ක් සහ රුපියල් බිලියන 2.4 ක් වශයෙන් ණය ආපසු ගෙවන ලදී.

- **ඉහළ ගිය වෙළඳපොළ පොලී අනුපාතිකවලට ප්‍රතිචාර දක්වමින් 2018 වසරේ පළමු මාස අට තුළ පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය අපේක්ෂිත මට්ටම් දක්වා මන්දගාමී විය.** ඒ අනුව, 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 14.7 හා 2017 අගෝස්තු මස අවසානය වන විට වාර්තා වූ සියයට 17.8 හා සාපේක්ෂව පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2018 අගෝස්තු මස අවසානය වන විට සියයට 14.3 ක් විය. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අමතරව, මෝටර් රථ වැනි ඇතැම් අංශ සඳහා සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑම පාලනය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාවට නංවනු ලැබූ සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග ද පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය පහළ යෑමට හේතු විය. කෙසේ වෙතත්, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ රුපියල් බිලියන 404.7 ක ඉහළ යෑම හා සාපේක්ෂව 2018 වසරේ පළමු මාස අට තුළ පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයේ ඉහළ යෑම රුපියල් බිලියන 449.1 ක් විය.

- **ආර්ථික කටයුතු සඳහා පහසුකම් සැලසීමට ප්‍රමාණවත් මූල්‍ය සම්පත් ප්‍රමාණයක් පවතින බව පෙන්නුම් කරමින් 2018 වසරේ පළමු භාගය තුළ ආර්ථිකයේ සියලු ප්‍රධාන අංශ සඳහා සපයන ලද ණය ප්‍රවාහ ඉහළ ගියේය.** වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, ඇතැම් ප්‍රදේශවල පැවති කාලගුණික අවහිරතාවලින් පසු ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්කිරීම සඳහා වැඩි වශයෙන්

**7.12 රූප සටහන**

**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.3 සංඛ්‍යා සටහන**

**වාණිජ බැංකු විසින් ලබා දුන් ණය සහ අත්තිකාරම් වර්ගීකරණය (අ) (ආ) (ඇ)**

රුපියල් බිලියන

| කාණ්ඩය | 2017 ජූනි අවසානයට | 2017 දෙසැම්බර් අවසානයට | 2018 ජූනි අවසානයට (ඈ) | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (2017 ජූනි /2018 ජූනි) | |
|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | % |
| **කෘෂිකාර්මික සහ ධීවර** | **382.0** | **412.4** | **443.3** | **61.3** | **16.0** |
| එයින්, තේ | 84.6 | 91.0 | 102.3 | 17.6 | 20.9 |
| රබර් | 25.3 | 24.4 | 27.5 | 2.2 | 8.7 |
| පොල් | 19.6 | 20.4 | 23.1 | 3.5 | 18.0 |
| වී | 32.3 | 32.6 | 33.8 | 1.5 | 4.6 |
| එළවළු, පළතුරු සහ සුළු ආහාර භෝග | 27.2 | 29.3 | 28.1 | 0.9 | 3.5 |
| ධීවර | 16.8 | 17.5 | 17.1 | 0.3 | 1.9 |
| **කර්මාන්ත** | **1,864.0** | **2,041.4** | **2,231.5** | **367.5** | **19.7** |
| එයින්, ඉදිකිරීම් | 902.8 | 993.5 | 1,069.7 | 166.9 | 18.5 |
| ආහාර සහ පාන වර්ග | 103.6 | 105.1 | 115.8 | 12.2 | 11.8 |
| රෙදිපිළි සහ ඇඟලුම් | 156.8 | 174.7 | 180.6 | 23.8 | 15.2 |
| සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 158.5 | 170.3 | 196.7 | 38.2 | 24.1 |
| **සේවා** | **1,331.0** | **1,393.9** | **1,520.6** | **189.5** | **14.2** |
| එයින්, තොග සහ සිල්ලර වෙළඳාම | 400.0 | 435.8 | 455.9 | 56.0 | 14.0 |
| සංචාරක ව්‍යාපාරය | 160.4 | 172.0 | 190.1 | 29.7 | 18.5 |
| මූල්‍ය සහ ව්‍යාපාරික සේවා | 306.6 | 306.5 | 356.3 | 49.7 | 16.2 |
| නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය | 22.7 | 19.2 | 20.4 | -2.3 | -10.0 |
| **පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඉ)** | **972.1** | **1,053.2** | **1,081.2** | **109.2** | **11.2** |
| එයින්, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ | 207.0 | 210.2 | 215.2 | 8.2 | 4.0 |
| උකස් ණය | 137.5 | 148.4 | 156.2 | 18.7 | 13.6 |
| ණය කාඩ්පත් | 82.0 | 91.5 | 92.8 | 10.8 | 13.2 |
| **එකතුව** | **4,549.1** | **4,900.9** | **5,276.6** | **727.5** | **16.0** |


(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වී ඇත.
(ආ) ණය, අයිරා සහ වට්ටම් කළ සහ මිලට ගත් බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් වේ.
(ඇ) ගණනය කිරීමේ ක්‍රමවේදවල වෙනස්කම් හේතුවෙන් මෙම සංඛ්‍යා සටහන 7.2 හි දැක්වෙන පෞද්ගලික අංශය සඳහා ලබාදුන් ණය යටතේ වන දත්තවලින් වෙනස් වේ.
(ඈ) තාවකාලික
(ඉ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' කාණ්ඩයට අයත්වන පෞද්ගලික නිවාස ණය ඉවත් කර ඇති අතර, ආරක්ෂණ ජාල යෝජනා ක්‍රමයට අදාළ ණය ද ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ණය ලබා දීම කිසියම් දුරකට පිළිබිඹු කරමින් 2018 ජුනි මස අවසානය වන විට කෘෂිකාර්මික අංශය සඳහා සපයන ලද ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 16.0 කින් වර්ධනය විය. මේ අතර, කාර්මික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය 2018 ජුනි මස අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 19.7 කින් වර්ධනය විය. කර්මාන්ත අංශයෙහි සියලු උප අංශ සඳහා සපයන ලද ණය වර්ධනයක් වාර්තා කළ අතර, කර්මාන්ත අංශය වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 48 ක් සහ පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 20 ක් වන ඉදිකිරීම් උප අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2017 වසරේ පළමු භාගයේ වාර්තා කළ සියයට 21.8 හා සාපේක්ෂව 2018 වසරේ පළමු මාස හය තුළදී සියයට 18.5 කින් වර්ධනය විය. තොග සහ සිල්ලර වෙළඳාම, සංචාරක, මූල්‍ය සහ ව්‍යාපාරික සේවා යන උප අංශ සඳහා සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සේවා අංශය සඳහා සපයන ලද ණය ප්‍රමාණය 2017 වසරේ පළමු භාගයේ වාර්තා කළ සියයට 15.8 හා සැසඳීමේදී 2018 වසරේ පළමු භාගයේදී සියයට 14.2 ක් විය. මේ අතර, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ සියයට 17.9 ක වර්ධනය හා සැසඳීමේදී පෞද්ගලික ණය හා අත්තිකාරම් අංශය යටතේ සපයන ලද ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 11.2 කින් වර්ධනය විය. 2017 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ සියයට 12.4 හා සැසඳීමේදී උකස් ණය අත්තිකාරම් වර්ධනය,

**7.13 රූප සටහන**

**ආර්ථිකයේ ප්‍රධාන අංශ සඳහා වාණිජ බැංකු විසින් ලබාදුන් ණය - 2018 (අ)**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2018 වසරේ පළමු භාගය තුළ වාණිජ බැංකු විසින් ලබාදුන් ණයෙහි වෙනස ප්‍රමාණාත්මක සංඛ්‍යා මගින් දක්වෙන අතර, 2018 ජුනි මස අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය ප්‍රතිශත මගින් නිරූපණය කෙරේ

**7.14 රූප සටහන**

**වාණිජ බැංකු විසින් ප්‍රධාන අංශ වෙත ලබාදුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2018 වසරේ පළමු භාගයේදී සියයට 13.6 දක්වා ඉහළ ගියද, 2017 වසරේ පළමු භාගයේදී සියයට 20.4 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම සඳහා සපයන ලද ණය වර්ධනය 2018 වසරේ පළමු භාගයේදී සියයට 4.0 දක්වා පහළ ගියේය.

## පුළුල් මුදල් සැපයුම ($M_4$)

- **මූල්‍ය ආයතනවල මුදල් වගකීම් රැස් කිරීම පහළ යෑම පිළිබිඹු කරමින් 2018 වසරේ පළමු මාස අට තුළ මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරනු ලබන පුළුල් මුදල් සැපයුමෙහි ($M_4$)[1] වර්ධනය තවදුරටත් මන්දගාමී විය.** පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) ප්‍රවණතාව හා සමානව 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 17.6 හා සැසඳීමේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත $M_4$ වර්ධනය 2018 වසරේ පළමු මාස අට අවසානයේදී සියයට 12.7 දක්වා මන්දගාමී විය. වගකීම් අංශයෙන් සලකා බලන විට, 2017 වසර අවසානයේදී පැවති සියයට 19.7 හා සැසඳීමේදී බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සතු කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතුවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2018 අගෝස්තු මස අවසානයේදී සියයට 14.0 ක් විය. බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සතු කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු 2017 වසර අවසානයේ වාර්තා

1 මූල්‍ය සමීක්ෂණය ද්‍රවශීලතාව පිළිබඳව වඩාත් පුළුල් මිනුමක් වන අතර, එයට මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්ද ඇතුළත් වේ.

**7.4 සංඛ්‍යා සටහන**

**පුළුල් මුදල් ($M_4$) සැපයුමෙහි වත්කම් අංශය (මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරන ලදී)**


රුපියල් බිලියන

| අංශය | 2017 අගෝස්තු අවසානයට | 2017 අවසානයට | 2018 අගෝස්තු අවසානයට (අ) | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 අවසානයට | | 2018 අගෝස්තු අවසානයට | |
| | | | | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **පුළුල් මුදල් ($M_4$)** | **7,457.0** | **7,795.9** | **8,403.3** | **1,165.7** | **17.6** | **946.3** | **12.7** |
| තුඩුදුන් සාධක | | | | | | | |
| ශුද්ධ විදේශීය වත්කම් | **-205.2** | **-34.2** | **3.0** | **349.0** | **91.1** | **208.3** | **101.5** |
| මුදල් අධිකාරීන් | 745.8 | 846.1 | 901.5 | 287.5 | 51.5 | 155.7 | 20.9 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -795.9 | -724.6 | -734.6 | 65.2 | 8.3 | 61.2 | 7.7 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් | -155.1 | -155.7 | -163.8 | -3.8 | -2.5 | -8.7 | -5.6 |
| ශුද්ධ දේශීය වත්කම් | **7,662.3** | **7,830.1** | **8,400.3** | **816.6** | **11.6** | **738.0** | **9.6** |
| දේශීය ණය | **9,595.6** | **9,841.8** | **10,679.4** | **1,078.5** | **12.3** | **1,083.8** | **11.3** |
| රජයට ලබාදුන් ශුද්ධ ණය | **2,843.2** | **2,778.9** | **2,903.5** | **223.1** | **8.7** | **60.3** | **2.1** |
| මුදල් අධිකාරීන් | 293.5 | 225.1 | 245.8 | -187.9 | -45.5 | -47.8 | -16.3 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 1,944.0 | 1,943.4 | 2,026.1 | 384.3 | 24.6 | 82.2 | 4.2 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 541.4 | 545.6 | 565.5 | 30.0 | 5.8 | 24.0 | 4.4 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 64.2 | 64.8 | 66.1 | -3.3 | -4.9 | 1.9 | 2.9 |
| රාජ්‍ය සංස්ථාවලට දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු) (ආ) | **521.5** | **537.0** | **639.5** | **23.2** | **4.5** | **118.0** | **22.6** |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය (ආ) | **6,230.9** | **6,525.8** | **7,136.4** | **832.2** | **14.6** | **905.5** | **14.5** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු (ආ) | 4,590.5 | 4,799.2 | 5,248.4 | 613.4 | 14.7 | 657.9 | 14.3 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 631.9 | 676.8 | 721.5 | 114.6 | 20.4 | 89.6 | 14.2 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,008.6 | 1,049.8 | 1,166.5 | 104.2 | 11.0 | 158.0 | 15.7 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) (ඇ) | **-1,933.3** | **-2,011.7** | **-2,279.1** | **-261.8** | **-15.0** | **-345.7** | **-17.9** |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) අනෙකුත් අයිතම වත්කම් සහ අනෙකුත් අයිතම වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.15 රූප සටහන**
**ඉතිරිකිරීමේ සහ කාලීන තැන්පතුවල වාර්ෂික ලක්ෂමය වර්ධනය ($M_4$ පුළුල් මුදල් සැපයුම අනුව)**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කළ සියයට 15.2 සහ සියයට 29.4 ක වර්ධනය හා සැසඳීමේදී 2018 අගෝස්තු මස අවසානය වන විට, පිළිවෙළින්, සියයට 9.6 සහ සියයට 9.2 ක් ලෙස වර්ධනය විය. $M_4$ පුළුල් මුදල් සැපයුමෙහි වත්කම් අංශය සැලකූ විට, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල ශුද්ධ දේශීය වත්කම් මෙන්ම, ශුද්ධ විදේශීය වත්කම්වල ඉහළ යෑම 2018 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ $M_4$ මුදල් වර්ධනය සඳහා හේතු විය. ඒ අනුව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 570.2 කින් සහ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 37.2 කින් ඉහළ ගියේය.

- **පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය 2017 අගෝස්තු මස අවසානය වන විට වාර්තා වූ සියයට 17.3 හා සැසඳීමේදී 2018 අගෝස්තු මස අවසානය වන විට සියයට 14.5 දක්වා මන්දගාමී විය.** 2017 වසර අවසානයේදී පැවති සියයට 11.0 හා සැසඳීමේදී බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය 2018 අගෝස්තු මස අවසානය වන විට සියයට 15.7 ක් වුවද, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ණය වර්ධනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2017 වසර අවසානයේදී පැවති සියයට 20.4 හා සැසඳීමේදී 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 14.2 දක්වා මන්දගාමී විය. $M_4$ පුළුල් මුදල් සැපයුම තුළ දේශීය ණය ප්‍රසාරණය සඳහා සියයට 73 කින් පමණ දායක වෙමින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි සිදුවූ ඉහළ යෑම, 2017 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ රුපියල් බිලියන 537.3 හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 610.6 ක් විය. තවද, මෙම කාලපරිච්ඡේදය තුළදී $M_4$ පුළුල් මුදල් සැපයුම තුළ රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 124.5 කින් ඉහළ ගිය අතර, ඒ සඳහා බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සපයන ලද ණය ප්‍රමාණය, පිළිවෙළින්, රුපියල් බිලියන 19.9 කින් සහ රුපියල් බිලියන 1.3 කින් ඉහළ යෑම හේතු විය.

## අපේක්ෂිත වර්ධනයන්

- **වසර 2020 වන විට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය ක්‍රමයෙන් හඳුන්වා දීම පහසු කිරීම පිණිස උද්ධමන ඉලක්කකරණ රාමුව ආයතනගත කිරීම සහ අවශ්‍ය කරනු ලබන නෛතික සංශෝධන හඳුන්වා දීමට අපේක්ෂා කෙරෙන අතර, රජය විසින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇතැයිද අපේක්ෂා කෙරේ.** නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන මූලිකාංගයක් වන විනිමය අනුපාතිකය නම්‍යශීලීව තීරණය වීමට ඉඩ සලසන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතට සංශෝධන එක් කිරීම සඳහා දැනටමත් කටයුතු කිරීම, මූලික සාර්ව ආර්ථික විචල්‍ය ආකෘතිකරණය සහ පුරෝකථනයට අදාළ තාක්ෂණික ශක්‍යතා වර්ධනය කිරීම, දත්ත එක්රැස් කිරීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය ශක්තිමත් කිරීම යනාදී පියවර ගණනාවක් ගෙන ඇත. ආදායම් රැස්කිරීම මත පදනම් වූ දැනට ක්‍රියාත්මක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා රජය තවදුරටත් කැපවී ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂිත අතර, ආර්ථික වර්ධනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන අඩු සහ ස්ථාවර උද්ධමනයක් අඛණ්ඩව පවත්වා ගැනීමට හැකිවන පරිදි නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව වෙත සාර්ථකව ප්‍රවේශවීම සඳහා එය මහ බැංකුවට උපකාරී වනු ඇත.